# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය - හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2011

## පෙරදිග සංගීතය

**6 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

නම/විභාග අංකය :..................................................................................................

- **I කොටසේ සියළුම ප්‍රශ්ණ වලට ද, II කොටසේ ප්‍රශ්ණ 3 කටද පිළිතුරු සපයන්න.**
- **II කොටසේ තෝරාගත් ප්‍රශ්ණ වලට පිළිතුරු වෙනත් කඩදාසියක ලියන්න.**
- **පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.**

I කොටස

1) නරිබෑණා නාට්‍යයේ ගීත නිර්මාණයට මූලික කරගෙන ඇත්තේ,
I. තබ්ලා ගීතයකි II. රබන් පදය III. දවුල් පදය IV. තම්මැට්ටමේ පදය

2) "ඇහැල මලින් ගස් පිරිලා" යන ගීතය,
I. නූර්ති ගීයකි II. නාඩගම් ගීයකි III. චිත්‍රපට ගීයකි IV. නව නාට්‍ය ගීයකි

3) නරිබෑණා නාට්‍යයේ සංගීත නිර්මාණයට දායක වී ඇත්තේ,
I. ආනන්ද සමරකෝන් මහතාය II. සුනිල් සාන්ත මහතාය
III. ඩබ්.ඩී.අමරදේව මහතාය IV. ලයනල් අල්ගම මහතාය

4) ශ්‍රී ලාංකීය සංගීතඥයෙක් වෙනත් රටක ජාතික ගීයක් නිර්මාණය කර ඇත. එම ගෞරවය හිමිවන්නේ,
I. සුනිල් සාන්ත මහතාටය II. ආනන්ද සමරකෝන් මහතාටය
III. ශාන්ති ගීතදේව මහතාටය IV. ඩබ්.ඩී.අමරදේව මහතාටය

5) සප්තකයට ශුද්ධ ස්වර
I. 4 කි II. 5 කි III. 6 කි IV. 7 කි

6) අපරදිග සංගීතයේ F ස්වරය පෙරදිග සංගීතයේ කිනම් ස්වරයද?
I. ස II. රි III. ග IV. ම

7) ස්වර සප්තකයේ හයවන ස්වරය
I. ග II. ම III. ධ IV. නි

8) සප්තකයේ නොවනස්ව පවතින ස්වර යුගලය,
I. ස - ම II. ම - ධ III. ස - ප IV. ස - ධ

9) කෝමල ස්වරයට වඩා ශුද්ධ ස්වරයේ හඬ
I. අඩුවේ II. වැඩිවේ III. නොවෙනස් වේ IV. අම්හිරි වේ

10) ජන ගී වර්ගීකරණය යටතේ කෙලි ගී අයත් වන්නේ,

I. සේගී වලටය II. මෙහෙ ගී වලටය III. සමාජ ගී වලටය IV. ජන ගී වලටය

11) "සාර සදිසි පෙති පේර නෙලන කල" ජන ගීතය,

I. කලගෙඩි කවියකි II. ඔලිඳ කවියකි III. මේවර කවියකි IV. ලී කෙලි කවියකි

12) තානම සහිතව ගැයෙන ජන ගීයකි

I. එළුවන් කෑම II. ඔලිඳ කෙලිය III. මේවර කෙලිය IV. කලගෙඩි කවි

13) " ඔලිඳ වැපුරුවද බල කොයි නෑනෝ " යන කවියේ දෙවන පදය වනුයේ,

I. තුන්පෙති වෙච්චද බලකොයි නෑනෝ II. දෙපෙති වෙච්චද බලකොයි නෑනෝ
III. එක්පෙති වෙච්චද බලකොයි නෑනෝ IV. රෑන් ඇදිච්චද බලකොයි නෑනෝ

14) එළුවා හා කොටියා වශයෙන් ප්‍රධානක සත්ව චරිත නිරූපණය වන ජන ක්‍රීඩාව වනුයේ,

I. ඔලිඳ කෙලිය II. මේවර කෙලිය III. පනා හැංගීම IV. එළුවන් කෑම

15) ස්වර පුවරු සංගීත භාණ්ඩ ගණයට අයත් නොවන භාණ්ඩය

I. සර්පිනාව II. මෙලෝඩිකාව III. වයලීනය IV. එකෝඩියන්

<u>හිස්තැනට සුදුසු පිළිතුර තෝරා ලියන්න.</u>

**[ එළුවන් කෑම , මේවර කෙලිය , කෙලි ගී , කලගෙඩි කවි , ඔලිඳ කෙලිය ]**

ජන ක්‍රීඩා මුල් කොට ගනිමින් නිර්මාණය වූ (16) ............................... අතර, එළුවා, කොටියා චරිත නිරූපණය කරමින් ගැමි දරුවන්ගේ විවේක කාලය සතුටු කරන්නට (17) ................................. කදිම ක්‍රීඩාවක් විය. නැති වූ ආභරණ සොයමින් ගයන (18) ................................. හා කාන්තාවන්ට විශේෂිත වූ (19) ................................... දෙපිල බෙදී කරන ගැමි ක්‍රීඩාවකි. (20) ................................... ගමේ පෙරහැරට විශේෂ වූවකි.

## II කොටස

- පලමුවන ප්‍රශ්ණය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

1) I. කෙලි ගී යටතේ ගැනෙන ජන ගී වර්ග හතරක් ලියන්න.
   II. මෙයින් ඔබ කැමති ජන කවියක් ලියා දක්වන්න.

2) I. නරිබෑනා නාට්‍යයෙහි ඇතුලත් " ඇහැල මලින් ගස් පිරිලා " ගීතය ලියා දක්වන්න
   II. නරිබෑණා නාට්‍යයෙහි සංගීතය නිර්මාණය කල සංගීතඥයාගේ නම කුමක්ද?

3) I. ස රි ග ම / ප - - - / ප ම ග රි / ස - - - / මෙම ශුද්ධ ස්වර ස්ථාපන ගීතයේ මුල් පේලි තුන ස්වර ප්‍රස්ථාර ගත කරන්න.
   II. එම ශුද්ධ ස්වර ස්ථාපන ගීතය ලියා දක්වන්න.

4) I. සප්තකයේ ස්වර නාම හා ස්වර සංඥා ලියා දක්වන්න.
   II. බටහිර සංගීතයේ ගායනයේදී යොදා ගන්නා අපරදිග ස්වර නාමයන් හා අපරදිග ස්වර සංකේතයන් ලියා දක්වන්න.